# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1721/31 - 2011 සැප්තැම්බර් 03 වැනි සෙනසුරාදා - 2011.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.7/2011.

**1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත**

2 වන වගන්තිය යටතේ නියෝගය

1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය මගින් ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

(අ) 1969 අංක 17 දරන විදුලි බල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද විදුලි බල මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවක් වන, 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ උපලේඛනයෙහි “විදුලි බලය සැපයීම” ලෙස නිශ්චිතව සඳහන් වන සේවාවකට අවහිරයක් හෝ බාධාවක් හෝ සිදුවිය හැකි බව; හෝ

(ආ) මෙම සේවාව පවත්වාගෙන යාම ජන ජීවිතයට අත්‍යවශ්‍ය; බව

මාගේ මතය වන අවස්ථාවක, විදුලිබල විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, මෙම නියමය මගින් -

(i) එකී 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ කාර්යය සඳහා එකී සේවාව “අත්‍යවශ්‍ය මහජන සේවාවක් ” විය යුතු බවටත් ; සහ

(ii) 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 3 වන වගන්තියේ විධිවිධාන එසේ සාදන ලද නියමය සම්බන්ධයෙන් අදාළ වන බවටත් ,

ප්‍රකාශයට පත්කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011, සැප්තැම්බර් මස 03 වන දින
කොළඹ දී ය.

1A - G 14606— 930 (2011/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.